# අයවැය හිඟය හා බදු අදායම

කේ.ඩී.එච්.යූ. ගුණසේකර[1] එම්.ඒ.ඩී.එන්. සඳමාලි[2]
කේ.ඩී.ඒ.කේ. ප්‍රනාන්දු[3] පී.ඒ.ටී. පද්මසිකා[4]

**සංක්ෂේපය**

සංවර්ධනය වෙමින් පවතින රටවල අයවැය හිඟය යනු බලවත් ගැටළුවක් බවට පත්ව තිබේ. අයවැය හිඟය තුළ බදු ආදායම කෙතරම් දුරකට වැදගත් වනවා ද යන්න දැක්වීමේදී, අයවැය හිඟය යන්න රජයක ආදායම ඉක්මවා රාජ්‍ය වියදම් ඉහළ යන තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය. ලයිමර් සහ ඔට්ස් ට අනුව බදු ආදායම යනු රජයක් විසින් කරනු ලබන අනිවාර්යය අය කිරීමක් වන අතර, එය රජයක්, ආදායම්, වියදම්, ප්‍රාග්ධන වත්කම් ආදිය උදෙසා පනවන බවත්, ඉන් බදු ගෙවන්නන්ට ඍජු ප්‍රතිලාභයක් ලැබිය නොහැකි වුවත් රජය අධ්‍යාපනය, සෞඛ්‍යය ආදිය උදෙසා කරනු ලබන වර්තන වියදම්වලින් වක්‍රාකාරව ප්‍රතිලාභ ලැබිය හැකි බවත් පැහැදිලි වේ. චීනය, කොරියාව වැනි ආසියාතික රටවල් කිහිපයක් හැරුණු විට අනෙකුත් ආසියාතික රටවල් සියල්ලක්ම මෙම අයවැය හිඟය තුළින් පීඩාවට පත්ව තිබේ. එමෙන්ම ලයිමර් සහ ඔට්ස් 2008 දී, කිමුරා 2006 දී ප්‍රකාශ කර ඇත්තේ, අයවැය හිඟය අඩු කර ගැනීම උදෙසා බදුකරණය වැදගත් ආර්ථික ප්‍රතිපත්තියක් බවයි. ශ්‍රී ලංකාවේ ද රජයේ මුළු ආදායමෙන් 85% ක් පමණ බදු ආදායම නිරූපණය වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටළුව වන්නේ අයවැය හිඟය අඩු කර ගැනීමට බදු ආදායම උපකාරී වේද යන්නයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු ලෙස අයවැය හිඟය හා බදු ආදායම අතර පවතින්නේ කවරාකාර සම්බන්ධතවයක් ද යන්න හඳුනා ගැනීමත් එම සම්බන්ධතාව තුළින් අයවැය හිඟය අඩු වේ ද යන්නත් සලකා බලා තිබේමෙම අධ්‍යයනය සඳහා අදාළ වන විචල්‍ය තීරණය කිරීමේ දී, අයවැය හිඟය පරායත්ත විචල්‍ය ලෙසත්, බදු අදායම ස්වායත්ත විචල්‍ය ලෙසත් ලබා ගත් අතර දත්ත රැස් කිරීමේ දී ද්විතීයික දත්ත මත පදනම් වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන වාර්තා තුළින් වර්ෂ 1995 සිට 2014 දක්වා වර්ෂ විස්සකට අදාල කාලයක් සඳහා දත්ත ලබා ගත් අතර ඉන්පසු එම දත්ත ‘SPSS’ මෘදුකාංගය භාවිතයෙන්, කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්, අපකිරණ මිනුම්, සහසම්බන්ධතා මිනුම් හා සරල ප්‍රතිපායනය ඇසුරෙන් විචල්‍ය දෙක අතර පැවති සම්බන්ධතාවය හඳුනා ගනු ලැබිණි.

[1]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, helanigunasekara@hotmail.com
[2]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akithmini41@gmail.com
[3]ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, sandamalimuthugoda1@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipatp@gmail.com

එහිදී වසර විස්සක කාලයක් දක්වා අයවැය හිඟයේ සාමාන්‍ය අගය රු.මි. 2322.75 ක්ද, බදු ආදායමේ සාමාන්‍ය අගය රු.මි. 442,109.50 වේ. එමෙන්ම මෙම විචල්‍යන් දෙකෙහි සම්මත අපගමනයන් ලෙස, අයවැය හිඟයේ රු.මි. 1257.31ක්ද, බදු ආදායමේ රු.මි. 317,293.14 ක්ද වේ. මෙම විචල්‍ය දෙක අතර පවතින්නේ ප්‍රතිලෝම සහසම්බන්ධතාවයක් වේ. මෙම විචල්‍යන් දෙකෙහි පියර්සන් සහසම්බන්ධතා අගය 0.958 ක් වීමෙන් එය තව දුරටත් පැහැදිලි විය. එහිදී බදු අදායම වැඩි වීමේදී, අයවැය හිඟය අඩුවන බවත්, බදු අදායම අඩු වන විට අයවැය හිඟය වැඩි වන බවත් ප්‍රකාශ වේ. මෙහිදී මෙම වර්ෂ 20ට අදාළව බදු අදායම එක් ඒකකයකින් වැඩි හෝ අඩු වන විට අයවැය හිඟය ඊට ප්‍රතිලෝමව 0.004කින් වෙනස් වේ. එය පර්යේෂකයින් ඇස්තමේන්තු කළ පහත සරල ප්‍රතිපයන ආකෘතියෙන් පැහැදිලි වේ (BD = -644.27+ (-0.004) xi). මෙම ආකෘතියේ, වෙසෙසියා මට්ටම 0.000 වීමෙන් 1% වෙසෙසියා මට්ටමෙන් ආකෘතියේ සංඛ්‍යානමය වශයෙන් විශ්වසනීය වන අතර, පරායත්ත විචල්‍යයේ මුළු විචලනයෙන් ප්‍රතිපායන ආකෘතියෙන් විස්තර වන ප්‍රමාණය 91%ක් පමණ ඉහළ අගයක් නියෝජනය කරන බව නිර්ණන සංගුණකයේ අගය 0.918ක් වීමෙන් පැහැදිලි වේ. ඒ අනුව නිගමනය කළ හැක්කේ, අයවැය හිඟය හා බදු අදායම අතර ශක්තිමත් ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවත්, බදු අදායම අයවැය හිඟය උදෙසා වැදගත් බලපෑමක් සිදු කරන බවත් ය.

**මුඛ්‍ය පද :** *අයවැය හිඟය, බදු අදායම*